විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 10/2009

අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2009 දිනය / திகதி / Date 2009- 05- 14

ත්‍රිවිධ හමුදාපතිවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්.

**සන්නද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා සාමාජික සාමාජිකාවන්**
**වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකවීම**

යුධ ගුවන් හා නාවික හමුදාවන්හි ස්වේච්ඡා බලකාය, නිත්‍ය උපසේවා බලකාය සහ ස්වේච්ඡා උපසේවා බලකායන්හි සාමාජික සාමාජිකාවන් හට වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි ප්‍රතිලාභ හිමිකර දීමට රජය තීරණය කර තිබේ. ඒ අනුව

*01 ස්වේච්ඡා බලකායන්හි සේවයේ නියුතුවූවන්*

*02 ස්වේච්ඡා බලකායන්හි සේවය කොට විශ්‍රාම ලැබූ සාමාජික සාමාජිකාවන්*

*03 මියගොස් ඇති සාමාජික සාමාජිකයන්ගේ කලත්‍රයා හෝ අනත්දරුවන්*

පහත සඳහන් කොන්දේසි වලට අනුකූලව මෙම විශ්‍රාම වැටුප් ක්‍රමයට බැඳීමට හා ප්‍රතිලාභ හිමිකර ගැනීමට අවස්ථාව සලසාදෙනු ලැබේ.

1. සන්නද්ධ හමුදාවල ස්වේච්ඡා බලකායේ, නිත්‍ය උපසේවා බලකායේ සහ ස්වේච්ඡා බලකායේ සාමාජිකයින් වෙත මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන දිනය 1981- 09- 01 දින වේ. එමෙන්ම, එම සාමාජිකාවන් වෙත විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන දිනය 1983- 08- 01 දින වේ.

2. 1981- 09- 01 දින හෝ ඉන්පසුව සන්නද්ධ හමුදාවන්හි ස්වේච්ඡා බලකායේ සාමාජිකයන් වන විට අනිවාර්යයෙන්ම වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. එමෙන්ම, 1983- 08- 01 දින හෝ ඊට පසුව සන්නද්ධ හමුදාවන්හි ස්වේච්ඡා හමුදාවන්හි සාමාජිකාවන් වන විට අනිවාර්යයෙන්ම වැන්දඹු පුරුෂ අනත්දරු ක්‍රමයට දායක විය යුතුය.

3. 1981- 09- 01 දිනට පෙර පත්වීම් ලබා එදිනට සේවයේ යෙදී සිටි යම් සාමාජිකයෙක් වේනොත් ඔහුටද, කලත්‍රයාටද, අනත්දරුවන් හෝ අනත්දරු භාරකරුටද මනාපය පලකළ හැකි අතර, එමෙන්ම 1983- 08- 01 දිනට පෙර පත්වීම් ලබා එදිනට සේවයේ යෙදී සිටි යම් සාමාජිකාවක් වේනොත් ඇයටද, කලත්‍රයාටද, අනත්දරුවන් හෝ අනත්දරු භාරකරුටද මනාපය පලකල හැකි අතර, මෙම මනාපයන් පලකල හැකි අවසාන දිනය 2010- 12- 31 වේ.



| | Telephone | Fax | | Telephone | Fax | | Telephone |
|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 |

E-mail: pensions@sltnet.lk
Web site: www.pensions.gov.lk

4. සේවයේ නියුක්ත යම් සාමාජිකයෙකුගේ හෝ සාමාජිකාවකගේ දායක මුදල් 2009 මැයි මස සිට අයකළ යුතු අතර, විශ්‍රාම ගැන්වීමේදී හිඟ වාරික මුදල් හා පොලිය විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් අයකළ යුතුය. එය ප්‍රමාණවත් නොවන්නේ නම් වාරික 60 කින් එම හිඟය මාසික විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

5. විශ්‍රාම ලබා ඇති සාමාජිකයෙකු සාමාජිකාවකගේ දායක මුදල් හා පොලී මුදල් වාරික 180 කින් අයකළ යුතුය. ඒ ඒ හමුදා විශ්‍රාම වැටුප් අංශ විසින් අයදුම්පත්‍ර අනුමත කිරීමේදී විශ්‍රාම වැටුපින් දායක මුදල් අයකිරීමට ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත දැනුම් දිය යුතුය.

6. සාමාජිකයා හෝ සාමාජිකාව මියගොස් ඇති විට කලත්‍රයා හෝ අනත්දරුවන් වෙත ප්‍රතිලාභ ගෙවීමේදී සම්පූර්ණ දායක මුදල හා පොලී මුදල අයවීමෙන් පසු ගෙවීම් කළ යුතුය.

7. දායක මුදල් හා පොලී අයකිරීම විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/ 2008 ට අනුකූලව සිදුවිය යුතුය.

මෙම විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වීමේදී පහත සඳහන් පරිදි ක්‍රියාකළ යුතුය.

i. PD1A ආකෘතිපත්‍රය සාමාජිකයා/ සාමාජිකාව විසින් සම්පූර්ණ කළ යුතුය. (සාමාජිකයා/ සාමාජිකාව මියගොස් ඇත්තේ නම් කලත්‍රයා/ අනත්දරුවන්/ අනත්දරු භාරකරු සම්පූර්ණ කළ යුතුය.) එම අයදුම්පත්‍රය පහත සඳහන් ස්වේච්ඡා බලසේනා අංශ වෙත භාරදිය යුතුය.

- **සේනාවිධායක**, ස්වේච්ඡා බලසේනා මූලස්ථානය, අකුරේගොඩ පාර, පැලවත්ත, බත්තරමුල්ල.
- **පරිපාලන අධ්‍යක්ෂ**, විශ්‍රාම වැටුප් අංශය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, කොළඹ.
- **අධ්‍යක්ෂ නාවික** (වැටුප් හා විශ්‍රාම වැටුප්), ශ්‍රී ලංකා නා. නෞ, "ගැමුණු", වැලිසර, රාගම.

ii. ඒ ඒ හමුදා විශ්‍රාම වැටුප් අංශ විසින් PD2A ආකෘතිපත්‍රය සම්පූර්ණ කොට (සාමාජිකයා/ සාමාජිකාව මියගොස් ඇති විට) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

iii. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ලිපිගොනු අනුමත කොට ගෙවීම් සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත යැවීමට පියවර ගනු ලැබේ.

iv. මේ වන විටත් සිවිල් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි වී ඇති රාජ්‍ය නිලධාරීන් ස්වේච්ඡා බලසේනාවන්හි සේවා නියුක්ත වුවද මෙම ලියාපදිංචිය අවශ්‍ය නොවේ.

වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචිය සඳහා අයදුම්පත්‍ර මෙම දෙපාර්තමේන්තුව වෙත යොමුකිරීමේදී පහත සඳහන් ලේඛණ සමඟ ඉදිරිපත් කළ යුතුය.

i. නිසි පරිදි සම්පූර්ණ කරන ලද PD1A සහ PD2A ආකෘතිපත්‍ර
ii. දායකයාගේ ජාතික හැඳුනුම්පතෙහි සහතික කළ පිටපත
iii. දායකයාගේ උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපත
iv. විවාහ සහතිකයේ මුල් පිටපත
v. කලත්‍රයාගේ උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපත
vi. කලත්‍රයාගේ හැඳුනුම්පතේ සහතික කළ පිටපත
vii. කලත්‍රයාගේ ඡායාරූප අලවන ලද භාණ්ඩාගාර 147 හා 148 ආකෘතිපත්‍රය
viii. නිලධාරියාගේ හෝ කලත්‍රයාගේ නම්වල වෙනස්කම් ඇති විට ඒ සම්බන්ධයෙන් වූ දිවුරුම් සහතිකය
ix. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/ 2008 අනුව ගණන්බැලූ වැන්දඹු අනත්දරු දායක මුදල
x. හමුදා විශ්‍රාම වැටුප් අංශ විසින් ගණන් බලනු ලබන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප
xi. සිවිල් විශ්‍රාම වැටුපක් හෝ වෙනත් ප්‍රදානයක් ලැබුවේ නම් ඒ පිළිබඳ තොරතුරු

(අත්සන)
කේ.ඒ .තිලකරත්න.
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. ලේකම් - රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය
5. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
6. දිසාලේකම්වරු
7. විගණකාධිපති

**PD 1A**

# සන්නද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා සාමාජික සාමාජිකාවන් වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය ලියාපදිංචිය සඳහා අයදුම් පත්‍රය.

(අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුය)

නිලධාරියා හෝ නිලධාරිනියගේ 2 ¼ x 3 ¼ ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් මෙහි අලවන්න

මියගොස් ඇතිවිට අවශ්‍ය නොවේ

1. සාමාජිකයා/සාමාජිකාව පිළිබඳ විස්තර..........
   - 1.1. සම්පූර්ණ නම :-..........
   - 1.2. මුලකුරු සමග නම :-..........
   - 1.3. උපන් දිනය :- වර්ෂය.......... මාසය.......... දිනය....
   - 1.4. ජාතික හැඳුනුම්පත් අංකය :-..........
   - 1.5. ස්ත්‍රී / පුරුෂ භාවය :-..........
   - 1.6. ආගම :- බෞද්ධ☐ හින්දු☐ ඉස්ලාම් ☐ කතෝලික☐ වෙනත්
   - 1.7. ජාතිය :- සිංහල☐ දෙමළ☐ මුස්ලිම්☐ වෙනත්☐
   - 1.8. පෞද්ගලික ලිපිනය :-..........
   - 1.9. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය..........
   - 1.10. ඉලෙක්ට්‍රොනික් තැපැල් ලිපිනය (තිබේනම්) :-..........
   - 1.11. පෞද්ගලික දුරකතන අංක :-..........
     - I. නිවස -..........
     - II. ජංගම-..........
   - 1.12. ෆැක්ස් අංකය (තිබේ නම්) :-..........
   - 1.13. විවාහකද/අවිවාහකද යන වග :-..........

2. පවුලේ විස්තර
   (විවාහක නිලධාරීන් පමණක් සම්පූර්ණ කළ යුතුය.)
   - (අ) කලත්‍රයාගේ සම්පූර්ණ නම(මයා/ මිය) :-..........
   - (ආ) දැනට භාවිතා කරන නම :-..........
   - 2.2 කලත්‍රයාගේ උපන් දිනය :-..........
   - 2.3 කලත්‍රයාගේ ජාතික හැඳුනුම්පත් අංකය :-..........
   - 2.4 විවාහ සහතික අංකය හා දිනය..........
   - 2.5 කලත්‍රයා මියගොස් ඇත්නම් මියගිය දිනය :-..........
   - **2.6 දරුවන් පිළිබඳ විස්තර :-**

| දරුවාගේ නම | ස්ත්‍රී/ පුරුෂ භාවය | උපන් දිනය ව මා දි | විවාහක/ අවිවාහක බව | ජාතික හැඳුනුම්පත් අංකය | රැකියාව (තිබේ නම්) |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

2.7 ආබාධිත දරුවන් පිළිබඳ විස්තර

| දරුවාගේ නම | ස්ත්‍රී/පුරුෂ භාවය | උපන් දිනය ව මා දි | ජාතික හැඳුනුම්පත් අංකය | ආබාධිත ස්වභාවය |
|---|---|---|---|---|
| | | | | |

2.8 පෙර විවාහයන් පැවතියේ නම් ඒ පිළිබඳ විස්තර

| භාර්යාව/ස්වාමි පුරුෂයාගේ නම | උපන් දිනය ව මා දි | විවාහ වූ දිනය | ජාතික හැඳුනුම්පත් අංකය | විවාහය අවසන් වූ ආකාරය | විවාහය අවසන් වූ දිනය |
|---|---|---|---|---|---|
| | | | | | |

2.9 මුස්ලිම් නීතිය යටතේ වෙනත් විවාහයන් තිබේ නම් ඒ පිළිබඳ විස්තර :-

| භාර්යාව/ස්වාමි පුරුෂයාගේ නම | උපන් දිනය ව මා දි | විවාහ වූ දිනය | ජාතික හැඳුනුම්පත් අංකය |
|---|---|---|---|
| | | | |

## 3 සේවා විස්තර

3.1 (අ) සන්නද්ධ සේවාව (යුධ/ගුවන්/නාවුක)........................
(ආ) සේවා ස්ථානයේ ලිපිනය........................
(ඇ) සේවාවෙහි ස්වභාවය (නිත්‍ය/ස්වේච්ඡා)........................
(ඈ) සේවා අංකය........................
(ඉ) නිලය........................

3.3. (අ) මුල් පත්වීම් දිනය(බඳවාගත් දිනය)........................
එදිනට ඒකාබද්ධ වැටුප........................
විශ්‍රාම වැටුප් සහිත දීමනා........................

3.4. (අ) වෙනත් සේවාවක සේවා නියුක්තව සිටියේද යන්න (ඔව්/නැත)...
(ආ) ඔව් නම් සේවාව සහ සේවා ස්ථානය........................
(ආ) එම සේවාවට අදාළ වැ.අ.වි.වැ. අංකය(තිබේ නම්)........................
(ආ) එදිනට ලැබුණ මාසික වැටුප........................

## 4 දායකයා හෝ දායිකාවගේ ප්‍රකාශය

1898 අංක 1 දරණ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල පිළිබඳ ආඥා පනත හා 1983 අංක 24 දරණ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පිළිබඳ පනතින්ද 1970 අංක 18 දරණ වැ.අ.වි.වැ (සන්නද්ධ බලසේනා) පනත, 1970.11.27 දිනැති නියෝග මාලාව 1998 අංක 60 දරණ වැ.අ.වි.වැ (සන්නද්ධ බලසේනා) පනතෙහි දැක්වෙන සංලක්ෂයන් කියවූ බවත් මම මෙයින් ප්‍රකාශ කරමි. එමෙන්ම මා මීට පෙර මෙවැනි ප්‍රකාශයක් සිදු නොකරන ලද බවද සහතික කරමි.

නම........................
තනතුර/නිලය........................
දිනය........................

........................
ප්‍රකාශක අත්සන

සැ.යු.සාමාජිකයා සාමාජිකාව මියගොස් ඇත්නම් කලත්‍රයා /අනත්දරුවන් භාරකරුට සම්පූර්ණකළ හැක

ඇමුණුම් ලේඛනයඃ-

- දායකයාගේ උප්පැන්න සහතිකය (පිටපත) / ජාතික හැඳුනුම් පත්පිටපත / විවාහ සතිකය මුල් පිටපත / නමෙහි වෙනසක් වෙතොත් දිවුරුම් සහතිකය
- කලත්‍රයාගේ උප්පැන්න සහතිකය (පිටපත) නමෙහි වෙනසක් වෙතොත් දිවුරුම් සහතිකය 2 ¼ x 3 ¼ ඡායාරූප පිටපත් 02 හා දරුවන්ගේ උප්පැන්න සහතික පිටපත්
- දරුවන්ගේ උප්පැන්න සහතික (පිටපත්)

මෙම අයදුම්පත සම්පූර්ණ කොට පහත සඳහන් ලිපිනයට භාරදෙන්න.
සේනාවිධායක, ස්වේච්ඡා බලසේනා මූලස්ථානය, අකුරේගොඩ පාර, පැලවත්ත, බත්තරමුල්ල
පරිපාලනඅධ්‍යක්ෂ, විශ්‍රාම වැටුප් අංශය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, කොළඹ.
අධ්‍යක්ෂ නාවික (වැටුප් හා විශ්‍රාම වැටුප්), ශ්‍රී ලංකා නා. නෞ. ".ගැමුණු" වැලිසර, රාගම.

PD 2A

# සන්නද්ධහමුදාස්වේච්ඡාබලසේනාසාමාජිකසාමාජිකාවන් වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය ලියාපදිංචිය සඳහා අයදුම් පත්‍රය.

(බඳවාගැනීමේ නිලධාරී/අදාළ අංශ ප්‍රධානි විසින් සම්පූර්ණ කළ යුතුය)

1 1.1 සන්නද්ධ සේවාව (යුධ/ගුවන්/නාවුක)..................................................

1.2 සේවා ස්ථානයේ ලිපිනය ..................................................

සේවාවේ ස්වභාවය (නිත්‍ය/ස්වේච්ඡා)

සේවා අංකය

රෙජිමේන්තුව/අංශය

1.3 දුරකතන අංකය..................................................

1.4 ඉලෙක්ට්‍රොනික් තැපැල් ලිපිනය..................................................

2. 2.1 සම්පූර්ණ නම :-..................................................

2.2 මුලකුරු සමග නම :-..................................................

2.3 ජාතික හැඳුනුම්පත් අංකය :-..................................................

2.4 (අ) නිලය ..................................................

(ආ) ඒකාබද්ධ වැටුප..................................................

(ඇ) විශ්‍රාම වැටුප් සහිත දීමනා

2.5. (අ) මුල් පත්වීමේ දිනය/ බඳවාගත් දිනය..................................................

(ආ) පෙර රාජ්‍ය සේවයක් පැවතියේ නම් (රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් හෝ වෙනත්) තොරතුරු දක්වන්න.

(ඇ) මුල් පත්වීමේ දිනය අනියම් සේවයේ හෝ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් සේවයේ නම් ඒ බව සඳහන් කරන්න..................................................

3. 3.1 වැ.අ.වි.වැ. දායක මුදල් ගෙවීම ආරම්භ කළ දිනය..................................................

3.2. වැන්දඹු හා අනත්දරු / වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් අයකිරීම නතර කර ඇත්නම් නතර කළ දිනය හා ඊට හේතු ..................................................

3.3. මීට පෙර අයදුම් පත්‍රයක් ඉදිරිපත් කර තිබේ නම් එම මූලික ප්‍රකාශය ඉදිරිපත් කළ දිනය..................................................

ඉහත නිලධාරියාගේ/නිලධාරිනිය ඉදිරිපත් කර ඇති PD1A අයදුම්පතේ සඳහන් තොරතුරු නිවැරදි වේ. ඔහු / ඇය වැ.අ.වි.වැ. ක්‍රමයට බැඳීමට සුදුසුකම් සපුරා ඇත. දායක මුදල් නිසිපරිදි අයකරන බව සහතික කරමි.

නම..................................................

තනතුර..................................................

දිනය..................................................

..................................................

බඳවා ගැනීමේ නිලධාරී/අදාළ අංශ ප්‍රධානි
යුධ/ගුවන්/නාවුක හමුදාපති වෙනුවට
නම සහිත නිල මුද්‍රාව

* සැ.යු. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 10/2009 අනුව නිසි පරිදි ඇමුණුම් තිබිය යුතුය